**ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 25 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 149.49 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 146.54 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.95 ක් හෙවත් සියයට 1.97 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 125.28 | 123.04 | 2.24 | 1.79 |
| මූලධන | 24.21 | 23.50 | 0.71 | 2.93 |
| **එකතුව** | **149.49** | **146.54** | **2.95** | **1.97** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.21 | 1.21 | 0.70 | 0.74 | 6.50 | 3.41 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0015/085/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.3,950 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ආ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

## 3.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා වර්ෂය අවසාන වන විට එම වැය විෂයයන්ගේ ඉතිරිය සළසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂ 1 ක සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.49,176 ක් වූ හිඟහිටි ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 විගණන හා කළමනාකරණ කමිටුව

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව 2016 ජුනි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාර මාණ්ඩලික නිලධාරීන්ට පමණක් තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවත්, අවස්ථා 11 කදී එකතුව රු.206,500 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත ලබාදී තිබුණි.

## 3.6 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**3.6.1 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දහම් පාසල්වල යටිතල පහසුකම් සඳහා රු.2,850,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ සඳහා එකතුව රු.1,623,200 ක් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 43 ක් හෙවත් රු.1,226,800 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) පදවි 7 ක දහම් පාසල් 18 ක් සඳහා ප්‍රතිපාදන සැලසීමට පූර්ව ඇස්තමේන්තු සකස්කර තිබුණි. නමුත් 2015 වර්ෂය සඳහා එම දහම් පාසල්වලට සංවර්ධන සහායයන් යටතේ ප්‍රතිපාදන ලබා දී නොතිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

ත්‍රිකුණාමලය පදවියේ නව රදගුරු හිමිපාණන්ගේ පදවි ප්‍රාප්තිය වෙනුවෙන් රු.500,000 ක ප්‍රදානයක් ලබාදී තිබුණු අතර එම කටයුත්ත ඉටු කිරීමට අදාළ නොවූ රු.86,120 ක බිල්පත් මුදලින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.8 පාඩු හා හානි**

----------------

2015 අගෝස්තු 18 දින වෑන් රථයක් අනතුරට පත්වීමෙන් සිදුවූ රු.33,155 ක අලාභය අයකරගෙන නොතිබුණු අතර එය විසර්ජන ගිණුමේ DGSA 07 හි සඳහන් කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 56 | 34 | 22 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 07 | 05 | 02 |
| | **එකතුව** | **67** | **41** | **26** |